**නුවරඑළිය ප්‍රාදේශීය සභාව - 2022**

**-----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

නුවරඑළිය ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට නුවරඑළිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු

කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉකුත් වර්ෂය වෙනුවෙන් ලැබී තිබුණු රු.360,000 ක දැන්වීම් පුවරු ආදායමක් සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයට අදාළ රු.524,500 ක දැන්වීම් පුවරු ආදායම් ගිණුම්ගත කර නොතිබුණි. | 2023 වර්ෂයේ නිවැරදි කරන බව | මූල්‍ය ප්‍රකාශනවලට නිවැරදි අගයන් ඇතුළත් කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ එකතුව රු.193,462 කට මිළදී ගෙන තිබුණු ලැප්ටොප් පරිගණක යන්ත්‍රය හා වෙක්පත් යන්ත්‍රය ප්‍රාග්ධනිත කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී නිවැරදි කරන බව | වත්කම් ප්‍රාග්ධනිත කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ණයහිමියන් රු.740,546 ක් වැඩියෙන් දැක්විණි. | ගිණුම්කරණ සටහන් උපයෝගී කර ඉදිරි වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශනය පිළියෙළ කිරීමට කටයුතු කරන බව | මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි ශේෂ දැක්විය යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂය තුළ ඉකුත් වර්ෂයේ සහ සමාලෝචිත වර්ෂ වෙනුවෙන් මුදලින් ලැබී තිබුණු මුද්දර බදු ආදායම රු.10,369,320 ක් ගිණුම්ගත කර නොතිබුණි. | වටිනාකම් හඳුනාගෙන නිවැරදි කරන බව | නිවැරදි වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |
| (ඉ) | ඉකුත් වර්ෂය වෙනුවෙන් ලැබී තිබුණු මුද්දර බදු රු.3,541,900 ක් සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස සලකා ගිණුම්ගත කර තිබුණි. | 2023 වර්ෂයේ වැරදි නිවැරදි කරවා ගැනීම සඳහා කටයුතු කරන බව | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතුය. |
| (ඊ) | රු.71,000 ක යතුරු පැදියක් මෝටර් රථ යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | මෝටර් රථ හා කරත්ත ගිණුමට ඇතුලත් කර නිවැරදි කරවා ගැනීමට කටයුතු කරන බව | ස්ථාවර වත්කම් ගිණුම් ගත කළ යුතුය. |
| (උ) | සමාලෝචිත වර්ෂයට අදාළ 2023 වර්ෂයේදී ගෙවීම් කරන ලද රු.608,166 ක් ණයහිමියන් යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේ ගිණුම පිළියෙළ කිරීමේදී නිවැරදි කරන බව | වියදම් ගිණුම්ගත කළ යුතුය. |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ 06 කට අදාළ මූලික පොත් හා උපයෝගී ලේඛනවල ශේෂයන් සමඟ සැසැඳීමේදී රු.3,892,531 ක නොසැසඳීමක් විය. | අදාළ වට්නාකම් ඇතුලත් කර ඉදිරි වර්ෂයේ ගිණුම පිළියෙළ කරන බව | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතුය. |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.11,937,327 ක් වටිනා ගිණුම් ශේෂ 06 කට අදාළ උපයෝගී ලේඛන සහ බදු ගිවිසුම් ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කළ නොහැකි විය. | අදාළ උපලේඛන සහ ගිවිසුම් පිළියෙල කර ඉදිරියේදී ඉදිරිපත් කරන බව | උපලේඛන පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

**නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම්**

නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- | --- |
| (අ) | අතුරු ව්‍යවස්ථා<br>---------------------<br>1988 අගෝස්තු 23 දිනැති අංක 520/7 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1952 අංක 06 දරන පළාත් පාලන සම්මත අතුරු ව්‍යවස්ථාවේ 39 වැනි අතුරු ව්‍යවස්ථාවේ, | | | |
| i. | 01 ඡේදය | ප්‍රාදේශීය සභාව විසින් 2020,2021 සහ 2022 වර්ෂයේ සැප්තැම්බර් දක්වා දැන්වීම් පුවරු 68 ක් සඳහා රු.8,835,775 ක ගාස්තු අය කර ඇතත් බලපත්‍රයක් නිකුත් කර නොතිබුණි. | 2023 වසරේ දැන්වීම් පුවරු සඳහා ගාස්තු අය කිරීමේදී අඩු පාඩු නිවැරදි කරන බව | අතුරු ව්‍යවස්ථාවේ නියමයන් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| ii. | 2 (උ) ඡේදය | වර්ග අඩි 8720 ක දැන්වීම් පුවරු සඳහා රු.1,308,000 ක ගාස්තු අයකර නොතිබුණි. | තවදුරටත් හිඟ අය කරවා ගැනීම සඳහා අදාළ ආයතන දැනුවත් කිරීමට අවශ්‍ය කටයුතු කරන බව | හිඟ ආදායම් අය කිරීමට කටයුතු කළ යුතුය |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛ<br>----------------------- | | | |
| | 1988 මැයි 17 දිනැති අංක 1988/22 දරණ චක්‍රලේඛය | සභා බල ප්‍රදේශයේ වරිපනම් බදු දේපළ 2009 වර්ෂයට පසු තක්සේරු කර නොතිබුණි. | නව සභා සංස්ථාපනය සිදු කිරීමෙන් පසුව නව තක්සේරු වාර්ථාවක් ලබා ගැනීම සඳහා අවස්ථා ගණනාවකදී සභාව ඉල්ලීම් කර ඇතත් තක්සේරු වාර්තා ලැබී නොමැති බව | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.5,234,153 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.10,872,109 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 4,578,000 | 4,430,583 | 5,117,826 | 1,940,827 | 4,578,000 | 5,476,754 | 3,960,440 | 2,628,070 |
| (ii) | කඩ කුලී | 6,547,916 | 85,865,475 | 86,330,192 | 1,020,167 | 7,491,667 | 6,228,598 | 8,660,973 | 1,484,884 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 2,767,000 | 2,301,478 | 2,301,478 | - | 4,000,000 | 1,966,059 | 5,913,747 | - |
| (iv) | වෙනත් ආදායම් | 58,700,821 | 15,086,522 | 12,365,771 | 6,741,728 | 67,630,827 | - | 53,269,545 | 4,020,977 |
| | | 72,593,737 | 107,684,058 | 106,115,267 | 9,702,722 | 83,700,494 | 13,671,411 | 71,804,705 | 8,133,931 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වරිපනම් හා බදු<br>------------------- | | |
| i. | 2008 සිට සමාලෝචිත වර්ෂය දක්වා කාලයට අදාළ රු.336,895 ක වරිපනම් බදු දුම්රිය දෙපාර්තමේන්තුවෙන් අයකර නොතිබුණි. | නානුඔය පිහිටි දුම්රිය දෙපාර්තමෙන්තුව වෙත මේ සම්බන්ධයෙන් අවස්ථා ගණනාවකදී දැනුවත් කර ඇති බව | හිඟ ආදායම් අය කිරීමට කටයුතු කළ යුතුය. |
| ii. | බදුහිමියන් 59 දෙනෙකුගෙන් රු.386,545 ක හිඟ වරිපනම් බදු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 හා 159 වගන්ති ප්‍රකාරව කටයුතු කර අයකර නොතිබුණි. | වරිපනම් විෂය නිලධාරින් දැනුවත් කර ආදායම් පරික්ෂකවරුන් මඟින් අය කරවා ගැනීමට කටයුතු කරන බව | - එම - |
| (ආ) | කුලී<br>----- | | |
| | රජයේ නිවාස වලින් සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට හිඟ කුලී රු.77,005 ක් 2018 වර්ෂයේ සිට අයකර නොතිබුණි. | පදිංචිකරුවෙකු වෙත හිටපු සභාපතිවරයෙකු සින්නක්කර ඔප්පුවක් ලබා දී ඇති අතර නීත්‍යානුකූලභාවය සම්බන්ධයෙන් නැවත සමික්ෂණයක් කරන බව | අයිතිය නිරවුල් කර හිඟ කුලී අය කළ යුතුය. |
| (ඇ) | ජල ගාස්තු<br>------------- | | |
| | ජල පාරිභෝගිකයන් 44 දෙනෙකුගෙන් 2018 වසරේ සිට රු.191,880 ක හිඟ ජල ගාස්තු අයකර ගෙන නොතිබුණි. | කොටස් ලෙස අය කරවා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරන බව | හිඟ ආදායම් අය කළ යුතුය |
| (ඈ) | උසාවි දඩ හා මුද්දර ගාස්තු<br>------------------------------- | | |
| | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු. 2,020,916 ක් හා මුද්දර ගාස්තු රු.4,720,812 ක් විය. | ගාස්තු අය කරවා ගැනීම කටයුතු කරන බව | හිඟ ආදායම් ගෙන්වා ගත යුතුය |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 27 වගන්තිය අනුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පවතින මාර්ග ගැසට් කිරීමට කටයුතු කර නොතිබුණි. | ගැසට් කිරීමට අදාළ මාර්ග ගණනය කර ඒ සඳහා අයවැයෙන් මුදල් වෙන්කරවා අවශ්‍ය කටයුතු සිදුකරන බව | සැලසුම් ප්‍රකාරව කාර්යයන් ඉටුකළ යුතුය. |
| (ආ) | 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 78 වගන්තියේ කාර්යයන් යටතට ගැනෙන ආහාර ස්වස්ථතාව සඳහා ආහාර සාම්පල පරීක්ෂා කිරීමටත්, ආහාර නිෂ්පාදන ආයතන දැනුවත් කිරීමටත් මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් හරහා සිදු කිරීමට ක්‍රියාකාරි සැලැස්මෙන් සැලසුම් කර තිබුණද, එම කාර්යය වර්ෂය තුළ ඉටුකර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදු කර නිවැරදි කරවා ගැනීමට කටයුතු සිදු කරන බව | - එම - |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් රු.24,325,000 ක ඉඩම් හා ගොඩනැගිලි 08 ක් ස්ථාවර වත්කම් ලේඛනයේ සඳහන්ව නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව | ස්ථාවර වත්කම් ලේඛනගත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට ගබඩාවේ කැනපිහට් හතරක් තිබියදී රු.745,000 ක් වැයකර කැනපි හට් 05 ක් මිළදී ගෙන තිබුණි. කැනපි හට් කුලී පදනම මත ලබාදීමේදී දිනකට රු.1,000 ක් සහ ආපසු ගෙවන රු.2,000 ක තැන්පතුවක් ලබාගත යුතු වුවත්, සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 20 කට වැඩි ප්‍රමාණයක් කදී ගාස්තු අය නොකර ලබාදී තිබුණි. | 2023 වර්ෂයේ සිට ආදායම් අය කිරීම සඳහා කටයුතු කරන බව | ආදායම් රැස් කිරීමට කටයුතු කළ යුතුය. |

### 3.3 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවට අයත් කිරිමැටිය කඩ කාමර 07 ක් බදුකරුවන් විසින් අනවසරයෙන් පෞද්ගලිකව නවීකරණය කරගෙන තිබුණු අතර සභා භූමියේ අළුතින් කඩ කාමර 04 ක් අනවසරයෙන් ඉදිකර තිබුණි. කඩ කාමර අංක 05 හා 06 ලබා දී තිබුණු කඩ කාමර හිමියා වෙත ප්‍රාදේශීය සභා සභාපතිවරයෙකු විසින් ඔප්පු ලබාදී තිබුණි. | අදාල දේපල සඳහා සභාව සමඟ ගිවිසුම් අත්සන් කර බදු අය කර නිවැරදි කරවා ගැනීම සඳහා කටයුතු කරන බව | සභා දේපලවල ආරක්ෂාව තහවුරු කළ යුතුය. |

**3.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | එඩිම්බරෝවත්ත මාර්ගයේ පොදු කාණු ඉදිකිරීමේ කර්මාන්තය රු.1,364,874<br>------------------------------------------- | | |
| i | කොන්ක්‍රීට් මිශ්‍ර කිරීමේ යන්ත්‍ර මඟින් ඉටුකළ හැකිව තිබියදී අතින් කොන්ක්‍රීට් ඇනීම(manual) සිදු කරන කර්මාන්තයක් ලෙස වැඩි රේටයක් යොදා ඇස්තමේන්තු කර ගෙවීම් කිරීම හේතුවෙන් රු.54,124 ක් වැඩිපුර ගෙවා තිබුණි. | අධිගෙවීම් රඳවුම් මුදල් ගෙවන අවස්ථාවේදී අය කරගන්නා බව | අවම පිරිවැයකට ඇස්තමේන්තු පිළියෙල කල යුතුය. |
| ii. | භෞතික පරීක්ෂාව අනුව කානු පද්ධතියේ කොන්ක්‍රීට් නිසි පරිදි තැලීම් නොකිරීම නිසා මී වද ලක්ෂණ පැවතුණි. කළු ගල් බැම්මේ කුස්තුර සඳහා නිසිලෙස බදාම යෙදීම සිදුකර නොතිබූ අතර මිනුම් වැඩිපුර දැක්වීම හේතුවෙන් බැම්ම ඉදිකිරීමේදී රු.56,031 ක් වැඩිපුර ගෙවා තිබුණි. | අධිගෙවීම් රඳවුම් මුදල් ගෙවන අවස්ථාවේදී අය කරගන්නා බව | ඇස්තමේන්තුගත ප්‍රමිතියට වැඩ ඉටු කරවා ගත යුතුය. |
| (ආ) | නානුඔය ක්‍රීඩාපිටිය සංවර්ධනය කිරීම. රු.1,486,600<br>--------------------------------------------- | | |
| i. | ඉංජිනේරු අනුමත පස් ඝණ මීටර් 750 ක් ක්‍රීඩාංගනය වෙත සපයා පිරවුම් කර මට්ටම් කිරීම සඳහා රු.1,468,600 ක් ගෙවා තිබුණද, පුරවන ලද පස් තුළ විශාල කලු ගල් ද අඩංගුව පැවතුණෙන් පිට්ටනියට යෙදූ පසු ඉංජිනේරු අනුමත පස් බවට හඳුනා ගත නොහැකි වූ අතර සමාලෝචිත වර්ෂයේදී ඉදිකිරීම අවසන් කර නොතිබුණි. | 2023 පෙබරවාරි 27 කර්මාන්තය නිමකළ බවත්, පුරවන ලද පස් පිළිබඳ ඉංජිනේරු නිර්දේශයක් ලබා ගන්නා බව | ඇස්තමේන්තුගත ප්‍රමිතියට වැඩ ඉටු කරවා ගත යුතුය. |
| iii. | 2022 මැයි 31 දින රු. 394,675 ක අත්තිකාරම් අදාළ කොන්ත්‍රාත්කාර සමිතිය වෙත ගෙවීම් කර තිබුණද, 2022 අගෝස්තු දක්වා වැඩ ආරම්භ නොකර කොන්ත්‍රාත්කාර සමිතිය විසින් මාස තුනක කාලයක් රජයේ මුදල් අවභාවිතා කර තිබුණි. | අවසන් බිල්පත ගෙවීමේදී අලාභය අයකර ගන්නා බව | අත්තිකාරම් ගෙවීම් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියා මාර්ග ගත යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආදායම් අංශය විසින් හිඟ ආදායම් සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමටත්, දේපල තහනම් කිරීමටත්, නඩු පැවරීමටත් අපේක්ෂා කළද, වසර තුළ එම කටයුතු ඉටුකර නොතිබුණි. | 2023 වසරේ සිට ක්‍රියාත්මක සැලස්ම අනුව කටයුතු කරන බව | සැලසුම් ප්‍රකාරව කාර්යයන් ඉටුකළ යුතුය. |
| (ආ) | සභාවේ කාර්ය පහසු කිරීම සඳහා සංවර්ධන උපදේශක කමිටු පිහිටුවීම හා ඒ අනුව සංවර්ධන ව්‍යාපෘති හඳුනාගැනීමට වාර්ෂික ක්‍රියාකාරි | 2024 වසරේ අයවැය සකස් කිරීමේදී සංවර්ධන උපදේශක කමිටු හරහා | සැලසුම් ප්‍රකාරව කාර්යයන් ඉටුකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සැලැස්මෙහි යෝජනා කර තිබුණද, ඒ අනුව කටයුතු කර නොතිබුණි. | යෝජනා ලබා ගැනීමට කටයුතු කරන බව | |
| (ඇ) | වර්ෂය තුළ ප්‍රජා දායකත්ව වැඩසටහන් ඉටුකරමින් ප්‍රජාව නිසි බල ගැන්වීමට ක්‍රියාකාරි සැලැස්ම තුළින් යෝජනා කළද, වසර තුළ ප්‍රජාව සවිබල ගැන්වීමේ වැඩසටහන් කිසිවක් ඉටුකර නොතිබුණි. | 2023 වසරේ සිට ක්‍රියාත්මක සැලසුම අනුව ඉදිරි කටයුතු සිදු කරන බව | සැලසුම් ප්‍රකාරව කාර්යයන් ඉටුකළ යුතුය. |
| (ඈ) | ප්‍රදේශයේ දරුවන් සැමට ප්‍රාථමික අධ්‍යාපනයක් ලබාදීමට අදාළ අරමුණ 04 ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණද, එම කාර්යයන් ඉටුකර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදු කර නිවැරදි කරවා ගැනීමට කටයුතු කරන බව | සැලසුම් ප්‍රකාරව කාර්යයන් ඉටුකළ යුතුය. |

**4.2 අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛනය අනුව ඇස්තමේන්තුගත ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී ආදායම් විෂයයන් 06 ක සියයට 21 සිට සියයට සියය ඉක්මවා සහ වියදම් විෂයයන් 05 ක සියයට 03 සිට සියයට සියය ඉක්මවා විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී පාලනකාරකයක් වශයෙන් යොදාගෙන නොතිබුණි. | අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කරන බව | අවශ්‍යතාවය සලකා බලා අවධානයෙන් අයවැය පිළියෙල කළ යුතුය. |

**4.3 පාරිසරික ගැටලු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නුවරඑළිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජල මූලාශ්‍ර බහුල හා ප්‍රධාන ගංගා වලට ජලය සැපයීමක් සිදු කරනු ලබන පරිසර පද්ධතියට හානියක් වන ආකාරයෙන් බල ප්‍රදේශයේ එක්රැස්වන කසළ මාස දෙකකට ආසන්න කාලයක සිට කසළ වර්ගීකරණයකින්ද තොරව ප්‍රධාන පාරට මායිම් වන එඩින්බරෝ වතුයායේ හිස් භූමියකට බැහැර කර තිබුණි. | අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කරන බව | ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කාර්යය සඳහා විධිමත් වැඩ පිළිවෙලක් සකස් කළ යුතුය. |

**4.4 තිරසර සංවර්ධන අරමුණු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 අංක 19 දරන තිරසර සංවර්ධන පනත ප්‍රකාරව තිරසර සංවර්ධන ඉලක්ක පිහිටුවීමක් වර්ෂය තුළ සිදුකර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදු කර නිවැරදි කරවා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරන බව | පනතේ නියමයන් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |